කැස්බෑව නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 අගෝස්තු 05 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරියට ලැබුණු වරිපනම් රු.3,512,864 ක මුදල කලින් ලද ආදායම් ලෙස ගිණුම් ගත නොකර ණයහිමියෝ යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි.ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉන්ධන තැන්පත් රු.1,045,000 ක් සහ ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත තබන ලද තැන්පත් රු. 115,920 ක් පෙර ගෙවුම් ලෙස සටහන් නොකර ආයෝජන යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ලැබිය යුතු හිඟ ආදායම් රු.1,442,851 ක් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ණය ගැතියෝ යටතේ ගිණුම්ගත නොකර විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | 2018 නොවැම්බර් මාසයට අදාලව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවිය යුතු රු.1,529,380 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි.ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ගෙවීමේ පදනම මත ලැබී තිබූ රු.24,714,000 ක් වූ කම්පැක්ටරයේ වටිනාකම ආදායම් ණයගැතියෝ යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි.ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>අසම්භාව්‍ය බැරකම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ------------------------ | --------------- | ------------------------ |
| බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිව පවරා ඇති නඩු 11 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති නඩු 01 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශනවල සටහන් වශයෙන් සභාව විසින් සහ සභාවට එරෙහිව පවරා ඇති නඩු වාර්තාවක් යා කිරීමට කටයුතු කර ඇත**.** |

(ඇ) <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| -------------------------- | --------------- | ------------------------ |
| මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයන් 05 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපලේඛනයන් සමඟ සැසඳීමේදී රු.1,331,734 ක් වැඩියෙන් සහ රු.1,178,956 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඈ) **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | ------------------------ | --------------- | ------------------------ |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කසල ගාස්තුව රු.2,655,916 ක් වූ අතර එම ශේෂය තුල 2015 ට පෙර සිට අයවිය යුතු රු.191,688 ක් සහ 2016 වර්ෂයට අදාල හිඟය රු.235,703 ක් පැවතියද, එම හිඟ මුදල් අයකර ගැනීමට අපොහොසත් වි තිබුණි. | ලැබිය යුතු කසල ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතුය. | 2015 වර්ෂයට පෙර හා 2016 වර්ෂයේ හිඟ මුදල් වැරදියට බිල් කිරීමක් වන බැවින් ලේඛනවලින් ඉවත් කිරිම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ii) | 2009 සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ වීදි ආලෝක ආධාර රු.481,578 ක් හා 2014, 2015 වර්ෂයන්ට අදාළව පිළියන්දල ක්‍රීඩා සමාජයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු රු.111,054 ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි. | වීථි ආලෝක ආධාර ශේෂය හා ලැබිය යුතු විදුලි ගාස්තු ශේෂය අය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | වීථි ආලෝක ආධාර රු.481,578 න් රු.254,748 ක් කපා හැරිම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඉතිරි රු.226,830 වැරදි බිල් කිරිමක් වන අතර සභා අනුමැතිය මත ලේඛනවලින් කපා හැරිමට |

| | | | |
|---|---|---|---|
| | | | කටයුතු කරන බව දන්වමි.පිළියන්දල ක්‍රීඩා සමාජයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු රු.111,054 ක් ගෙවීමට ක්‍රීඩා සමාජය එකඟ වී ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පොදු පහසුකම් මධ්‍යස්ථානයෙන් අයවිය යුතු රු.68,790 ක් සහ විනෝද බදු රු.281,047 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විනෝද බදු හා අනෙකුත් ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | රු.44,865 අයකර ගැනිමට නඩු පවරා ඇත. රු.23,925 කපා හැරිමට විෂයභාර අමාත්‍යවරුන් වෙත යොමු කිරිමට නියමිතය.විනෝද බදු රු.281,047 කපා හැරිම සඳහා අනුමැතියට යොමු කර ඇත. |
| (iv) | 2018 ජනවාරි 01 දිනට රථ ගාල බදු දීමෙන් අයවිය යුතු රු.310,957 ක මුදලින් රු.229,457 ක් හෙවත් සියයට 74 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | බදු මුදල් එකවර අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | රු.206,260 කපාහැරිමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. රු.86,500 අයකරගෙන ඇත. ඉතිරි රු.18,197 මාසිකව අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (v) | 2007 සිට 2018 දක්වා කාලපරිච්ඡේදයට අදාල හිඟ අත්තිකාරම් ශේෂය වූ රු.181,203 ක මුදල සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් මුදල් නියමිත කාලය තුලදී නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුවේ. | වසර 12 ට වඩා පැරණි ලිපිගොනු හෙයින් අස්ථානගත වී ඇති බවත් එවකට සිටි නිලධාරින් නොමැති බැවින් කපා හැරිමට කටයුතු කරමි. |
| (vi) | ආදායම් ණයගැති ශේෂයෙහි ඇතුළත් හිඟ මුද්දර ගාස්තු වටිනාකම රු.435,994,817 ක් වුවද ඉන් 2015 හා 2016 වර්ෂයන්ට අදාල හිඟය රු.274,824,817 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (vii) | ලැබිය යුතු දේපළ ණය පොළී ශේෂය රු.1,681,553 ක් වුවද ඉන් 2016 සහ 2017 වර්ෂ වලට අදාල හිඟ පොළිය රු.869,688 ක් විය. | දේපළ ණය පොළී අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පලාත් පාලන කොමසාරිස් වෙත මුදල් ප්‍රතිපූර්ණය කර ඇත. |

(ඉ) **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු. 684,952,402 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන හෝ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කල යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනය සමඟ නිවැරදි කර ඉදිරිපත් කරමි. |

1.4 **<u>අනුකූල නොවීම.</u>**

1.4.1 **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>**

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| **(i)** මු.රෙ.570 හා 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.15,773,446 ක තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මු.රෙ.570 හා 571 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| **(ii)**මු.රෙ. 1653 | නගර සභාවට අයත් ට්‍රැක්ටර් 03 ක මයිලෝමීටර් අක්‍රියව පැවතුණි. | මු.රෙ. 1653 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරික්ෂාව සිදුකර නොතිබුණි. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | වාහන **04** ක ඉන්ධන පරිභෝජනය ස්වාධීන නිලධාරියෙකු මඟින් පරීක්ෂා කර ඇති අතර අනෙකුත් වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමට දින නියම කරගෙන ඇති බව දන්වමි**.** |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ
----------------------

| | | | |
|---|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන යාමට ගබඩා භාරකරුට උපදෙස් දී ඇත. |

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
--------------------

| | | | |
|---|---|---|---|
| 16 වගන්තිය | සේවක අර්ථසාධක අරමුදලට නියමිත පරිදි දායක මුදල් නොගෙවීම නිසා අධිභාරයක් ද සමඟ රු.2,857,034 ක හිඟ මුදලක් සභා අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි. | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු අතර මු.රෙ.156 ප්‍රකාරව වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | නිසි උපදෙස් නොලැබුණ හෙයින් එසේ සිදුකිරිමට නොහැකි වූ බව දන්වා ඇත. 2008 සිට 2012 දක්වා කාලසීමාව තුල රාජකාරි ඉටුකල නිලධාරින් 03 දෙනෙකු සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 75,226,872 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 32,970,047 ක් විය**.**

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් **31** දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් **31** දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** |
| වරිපනම් හා බදු | 72,735 | 87,995 | 98,113 | 44,401 | 48,160 | 39,441 | 36,123 | 21,985 |
| කුලී | 17,462 | 18,802 | 20,672 | 3,373 | 13,750 | 19,985 | 19,410 | 2,388 |
| බලපත්‍ර ගාස්තු | 1,950 | 1,293 | 1,594 | - | 4,551 | 5,004 | 5,004 | - |
| වෙනත් ආදායම් | 200,907 | 160,501 | 295,875 | 466,797 | 282,965 | 284,961 | 330,555 | 232,207 |

2.2.2 **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥාපනතේ 170 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.44,401,255 ක් වූ අතර එහි රු.50,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 22 කින් අයවිය යුතු රු.1,934,526 ක මුදලක් විය. | බිල් කරන ලද වරිපනම් බදු ආදායම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2019.05.31 දින වන විට රු.10,804,712 අය වී ඇති අතර එදිනට හිඟ මුදල 33,596,543 දක්වා අඩු වී ඇත. හිඟ වරිපනම් හා බිල්කල වරිපනම් එකතු කිරීමට ආදායම් සැලැස්මක් සකස් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට බිල්කල වරිපනම් රු.78,934,084 ක් වුවද, ඉන් වර්ෂය තුලදී රු. 32,271,729 ක් හෙවත් සියයට 41 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වූ මුදල රු.28,913,268.12 ක් හෙවත් 36.6% කි. |
| (ඇ) | 2018 ජනවාරි 01 දිනට පැවති රු.21,686,827 ක් වු හිඟ වරිපනම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.8,150,724 ක් අයකරගෙන තිබූ අතර රු.13,536,103 ක් හෙවත් සියයට 62.42 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ වරිපනම් හා බිල්කල වරිපනම් එකතු කිරීමට ආදායම් සැලැස්මක් සකස් කර ඇත. |

2.2.3. කසළ බදු

| | | | |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු.1,388,191 ක කසළ බදු හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 960,800 ක් අයකර ගෙන තිබූ අතර හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 69.21 ක් පමණි. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | තව දුරටත් අයකළ යුතු හිඟ මුදල රු. 427,391 ක් වන අතර එම මුදල 2016 හා ඊට පෙර වර්ෂවලට අදාල මුදල්ය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කසළ බදු හිඟය රු.2,655,916 ක් විය. | කසළ බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මෙම හිඟ මුදල අයකර ගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිඛිතව දැනුම් දී ඇත. 2019 වර්ෂයේ සිට මුදල් අයකර ගැනීමෙන් අනතුරුව පමණක් සේවාව සැපයීම සිදු කරනු ලැබේ. |

2.2.4 <u>කුලී</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | දිගු කාලීනව බදු දෙන කඩකාමර වලින් 2018 වර්ෂය සඳහා බිල්කල ආදායම රු.12,656,160 ක් වුවද ඉන් රු.11,402,525 ක් අයකර ගෙන තිබූ අතර රු. 1,253,635 ක් අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදල අයකර ගැනීම සඳහා කඩ හිමියන් දැනුවත් කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 2018 ජනවාරි 01 දිනට පැවති රු.2,383,800 ක් වූ සමුච්චිත හිඟ මුදලින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,143,995 ක් හෙවත් සියයට 48 ක් අයකර ගෙන තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු අතර ලැබිය යුතු ආදායම් වර්ෂය තුලම ලබා ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදලින් රු. 1,039,665 ක් වූ පැරණි මාළු කඩ හිඟ මුදල කපා හැරීම සඳහා අනුමැතියට යොමු කර ඇත. |
| (ඇ) | සභාව සතු දිගු කාලීනව බදු දෙන දේපල 135 කින් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.2,493,440 ක් වූ අතර එම ශේෂය තුළ ඇතුළත් වාරික 10 වැඩි දේපල 21 ක හිඟ මුදල රු.1,474,515 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට හා වර්ෂයේ ආදායම් අදාල කාලය තුල ලබා ගැනිමට කටයුතු කල යුතු අතර හිඟය අවම කිරීමට පියවර ගත යුතුවේ. | දේපළ 21 න් රු. 1,039,665 ක් වටිනා දේපළ 14 ක්, කපා හැරීම සඳහා අනුමැතියට යොමු කළ පැරණි මාළු කඩවල් වේ. ඉතිරි කඩ 7 හි හිඟ මුදල රු.434,850 න් රු.146,650 ක් අයකරගෙන ඇති අතර තවදුරටත් අයකළ යුතු හිඟ ශේෂය රු. 288,200 කි. |
| (ඈ) | හිඟ මුදල් අය කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර රු.1,039,665 ක් වන පැරණි මාළු කඩ හිඟ මුදල කපා හැරීම සඳහා 2019 ජනවාරි 21 දින අමාත්‍යාංශ අනුමැතියට යොමුකර තිබුණද 2019 පෙබරවාරි 20 වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු අතර ඉදිරියේදි වර්ෂයට අදාල බදු ආදායම් වර්ෂය තුල අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**2.2.5 වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දෙන දේපල**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දෙන දේපල වලින් 2018 වර්ෂය සඳහා බිල්කිරීම් රු.6,052,103 ක් වුවද ඉන් රු. 5,743,481 ක් වර්ෂය තුළ අයකර ගෙන තිබූ අතර රු.308,622 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දෙන දේපල ආදායම අයකර ගත යුතුවේ. | රථගාලේ 2018 වර්ෂයට අදාල හිඟ මුදල වන රු.308,622 අයකර ගැනීම සඳහා නඩු පැවරීමට අවශ්‍ය සියළු ලිපි ලේඛන මේ වන විට සභාවේ නීතිඥවරයා වෙත භාරදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි 01 දිනට පැවති රු.390,907 ක් වූ සමුච්චිත හිඟ මුදලින් සමාලෝචිත වර්ෂය තුළ රු.81,500 ක් හෙවත් සියයට 20.84 ක් අයකර ගෙන තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

2.2.6 <u>බලපත්‍ර ගාස්තු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| (අ) | සභා බල ප්‍රදේශය තුළ 2018 දෙසැම්බර් 31 දිනට වරිපනම් ගෙවන ව්‍යාපාර ස්ථාන සංඛ්‍යාව 7854 ක් වුවත්, 2018 වර්ෂය තුළ වෙළඳ බලපත්‍ර සඳහා මුදල් ගෙවා තිබූ ව්‍යාපාර සංඛ්‍යාව හා ව්‍යාපාර බදු ගෙවා තිබූ ව්‍යාපාර සංඛ්‍යාව 3439 ක් වී තිබුණි. මේ අනුව ව්‍යාපාර ස්ථාන 4415 කින් වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. සමීක්ෂණයෙන් ප්‍රදේශයේ ඇති සත්‍ය වෙළඳ ව්‍යාපාර සංඛ්‍යාව තහවුරු කල යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කිරීමේදී, ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව 7854 ක් ලෙස පෙන්නුම් කරන බව ආදායම් පරීක්ෂකවරුන් විසින් පෙන්වා දී ඇත. වෙළඳ බලපත්‍ර සමීක්ෂණයේදී හා ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අදාල නොවන ස්ථාන පිළිබඳ තොරතුරු එක්රැස් කර ලබාදෙන බව ඔවුන් විසින් දැනුම් දී ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.254,114 ක් වූ හිඟ බලපත්‍ර වටිනාකමෙන් රු. 241,109 ක් හෙවත් සියයට 94.8 ක් සමාලෝචිත වර්ෂ අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2018.12.31 දිනට ලැබිය යුතු රු. 254,114 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති අතර ඒ අනුව හිඟ ගාස්තු අයවෙමින් පවතී. |
| (ඇ) | 2013 වර්ෂයට පෙර සිට පැවත එන රු.107,825 ක හිඟ බලපත්‍ර ගාස්තුව ලේඛන වලින් කපා හැරීම සඳහා 2018 දෙසැම්බර් 16 දින විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර තිබුණද 2019 මැයි මස 27 දින වන විටත් අදාල අනුමැතිය ලැබී නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු අදාල කාලසීමාව තුල අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2013 වර්ෂයට පෙර අයවිය යුතු හිඟ බලපත්‍ර ගාස්තු කපා හැරීම සඳහා යොමු කළද අඩුපාඩු පෙන්වා දී නිවැරදි කරන ලෙස ආපසු හරවා එවා ඇත. අඩුපාඩු නිවැරදි කර නැවත අනුමැතියට ඉදිරිපත් කරන බව දන්වමි. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1. <u>කාර්ය සාධනය</u>

(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| -------------------------- | --------------- | ------------------------ |
| සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට පෙර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර විධිමත් පරිදි අනුමත කර ගෙන නොතිබූ අතර 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ක්‍රියාකාරකම් සඳහා ගතවන කාලසීමාව හා කාර්යසාධනය පැහැදිලිව | ක්‍රියාකාරී සැලැස්ම පැහැදැලිව ක්‍රියාකාරකම් හා ගතවන කාලය ඇතුළුව සකස් කර අදාල වර්ෂයට පෙර ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා බව දන්වමි. |

හඳුනා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු දක්වා නොතිබුණි.

(ආ) **<u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම් අත්සන් කර තිබූ ගිවිසුම්ගත වටිනාකම රු.2,463,727 ක් වූ ව්‍යාපෘති 10 ක වැඩ 2019 මැයි මස 21 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති අදාල ගිවිසුම් ගත කාලපරිච්ඡේදය තුල ඉටු කල යුතුවේ. | ඇතැම් ව්‍යාපෘති 2019 වර්ෂයේ අවසන් කර ඇති බවත් ප්‍රමාද වූ ව්‍යාපෘති වලට හේතු ඉදිරිපත් කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කිරීමට ගිවිසුම් අත්සන් කර තිබූ ගිවිසුම්ගත වටිනාකම රු. 708,063 ක් වූ ව්‍යාපෘතියක් අවලංගු කර තිබුණි. | ගිවිසුම් ගත ව්‍යාපෘති ඉටුකල යුතුවේ. | අවලංගු කිරිමට හේතු දක්වා ඇත. |

(ඇ) **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂය තුල වෙන් කරන ලද කසළ ටොන් 9,081 ක් හා මිශ්‍ර කසළ ටොන් 14,140 ක් කරදියාන කසළ අංගනයට භාර දී තිබුණු අතර මුළු කසළ ප්‍රමාණයෙන් වෙන් කළ කසළ ප්‍රතිශතය සියයට 39.1 ක් වී තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කල යුතුවේ. | ඉදිරියේදී මිශ්‍ර කසල ප්‍රමාණය අවම කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | 2018 වර්ෂය තුල වෙන්කල කසළ වෙනුවෙන් රු. 2,199,000 ක් හා වෙන් නොකරන ලද කසළ වෙනුවෙන් රු.13,743,300 ක් සභාව දරා තිබූ අතර නිසි පරිදි කසළ කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු.11,544,300 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදුව තිබුණි. | කසළ කළමනාකරණ ව්‍යාපෘතිය අදාල කාලසිමාව තුල ක්‍රියාත්මක කල යුතුවේ. | ඉදිරියේදී මිශ්‍ර කසල ප්‍රමාණය අවම කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | කැස්බෑව නගර සභාව ඇතුළු පළාත් පාලන ආයතන 08 ක් කසළ බැහැර කරනු ලබන කරදියාන අපද්‍රව්‍ය අංගනය පිහිටි භූමියෙන් සියයට 80 ක භූමි ප්‍රමාණයක් කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් බැවින් සභා බල ප්‍රදේශයේ ජනතාවට ඉදිරියේ දී සෞඛ්‍ය හා පරිසර ගැටළු ඇතිවීමේ අවදානම් තත්වයක් පැවතුණි. | වගකිව යුතු පාර්ශව දැනුවත් කල යුතුවේ. | පවතින අවදානම් තත්වය පිළිබඳව මගේ අංක කැනස/5/1//1/2019 හා 2019.04.25 දිනැතිව අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු වගකිවයුතු පාර්ශවයන් වෙත ලිපි යොමු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) සභාව සතු පැරණි තානායම කඩා ඉවත්කර රු.52,929,240 ක ඇස්තමේන්තුවක් යටතේ නව ගොඩනැගිල්ලක පළමු අදියර ඉදිකර 2014 දෙසැම්බර් 04 දින සභාවට භාරදී තිබූ අතර තානායමින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ආදායමක් උපයා නොතිබුණි. | ආදායම් උපයා ගැනීමට කටයුතු කල යුතුවේ. | නව සභාව පත්වීමෙන් අනතුරුව තානායමේ දෙවන අදියර ආරම්භ කර ඇති අතර ඉදිරි මාස කිහිපය තුළ අවසන් වීමට නියමිතය. ඉදිරියේදී බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) හල්පිට පොදු සුසාන භූමිය සඳහා මිනුම් කටයුතු සිදු කර බිම් සැලැස්මක් සකස් කර ගැනීමට 2018 වර්ෂය අවසන් වන විටත් සභාව අපොහොසත් වී තිබුණි. | බිම් සැලැස්මක් සකස් කර ගැනීමට කටයුතු කල යුතුවේ. | හල්පිට සුසාන භූමිය සඳහා තාක්ෂණ නිලධාරි විසින් මැනුම් කටයුතු සිදු කිරීමට යාමේදී ප්‍රදේශ වාසීන්ගෙන් විරෝධතා මතුවීම හේතුවෙන් මැනුම් කටයුතු සිදු නොවුනි. |
| (ඇ) සුසාන භූමි 06 ක ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැටක් හෝ තාප්පයක් ඉදිකිරීමට 2018 වර්ෂයේ අවසාන වනවිටත් නගර සභාව අපොහොසත් වී තිබූ අතර සුසාන භූමි සතු ඉඩම් අනවසර අල්ලා ගැනීම් වලට භාජනය වී තිබුණි. | සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූලව සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර මේ වන විට සුසාන භූමි 5 ක මැනුම් නියෝග ලැබී මැනුම් කටයුතු ආරම්භ කර ඇත. |

3.3. <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට මාණ්ඩලික මට්ටමේ තනතුරු 02 ක්ද, ඇතුලත්ව සේවක පුරප්පාඩු 04 ක් හා ද්වීතියික මට්ටමේ එක් සේවකයෙකු අතිරික්තවද පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇති බවත් ප්‍රාථමික මට්ටමේ යන්ත්‍ර ක්‍රියාකරුගේ පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම මත තනතුර පුරප්පාඩුව පවති. |
| (ආ) මෙම සේවකයන්ට අමතරව මාණ්ඩලික හා තෘතියික මට්ටමේ තනතුරු සඳහා අනියම් පදනම මත වැඩ බලන නිලධාරීන් දෙදෙනෙක්ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියෙක්ද සමාලෝචිත වර්ෂය තුළ සේවයේ යොදවාගෙන තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | වැඩ බැලීමේ හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් සේවයේ යොදවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව බඳවාගෙන ස්ථිර පත්වීම් ලබා දී තිබූ සේවකයන් 48 දෙනෙකුට වැටුප් වශයෙන් 2015 සිට 2018 වර්ෂය දක්වා ගෙවා තිබූ රු.51,219,350 ක මුදල ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරිමෙන් අනතුරුව පමණක් වැටුප් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. පෙර වැටුප් ගෙවීම් සභාව විසින් දරනු ලැබේ. |
| (ඈ) | අනුමත ස්ථිර සේවකයන්ට අමතරව සභාවේ ව්‍යාපෘති වෙනුවෙන් බඳවා ගෙන තිබූ සේවකයන් 54 දෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.6,474,650 ක් ගෙවා තිබුණි. | කම්කරු ඇතුළු අනුමත සේවක සංඛ්‍යාව වර්ෂය මුලදී හඳුනාගෙන අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කල යුතුවේ. | කසළ කළමනාකරණය හා ඩෙංගු වැඩසටහන් යනාදී කාලීන අවශ්‍යතාවයන් සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත මෙම ව්‍යාපෘති සේවකයන් බඳවාගෙන සභාවේ අයවැය ලේඛණයෙන් මුදල් ප්‍රතිපාදනය කරගෙන වැටුප් හා දීමනා ගෙවා ඇත. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු. 34,557,488 ක් වූ අතර එම ශේෂය තුල ඇතුලත් නිලධාරීන් 11 දෙනෙකුගෙන් වර්ෂ 2011 සිට 2016 දක්වා අයවිය යුතු රු.307,226 ක ණය ශේෂ වලින් සමාලෝචිත වර්ෂය තුල කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | ණයකරුවන් ණය පැහැර අරින අවස්ථාවන්හි ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කල යුතුය. | අයකරගත නොහැකි ඇතැම් ශේෂ කපාහැරීමට ඉදිරිපත් කර ඇත. |
| (ඊ) | 2016 මැයි 09 දින සිට ලේකම් තනතුරට හා 2015 සැප්තැම්බර් 16 දින සිට ශ්‍රී. ලං. තා. සේවය (විශේෂ) තනතුරට දිගු කාලීනව වැඩ බලන නිලධාරීන් පත්කර තිබුණි. | ස්ථිර නිලධාරින් පත්කර ගැනීමට කටයුතු කල යුතුවේ. | තෘතියික මට්ටමේ වැඩ බැලීමේ තනතුරුවලට ස්ථිර නිලධාරින් පත් කිරීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරයි.ස්ථිර නිලධාරීන් පත් කරන තෙක් ලේකම් හා ශ්‍රී.ල.තා. සේවය (විශේෂ) තනතුරු සඳහා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් වැඩ බැලීමට පත්කර ඇත. |

3.4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| සුසාන භූමි 14 න් 13 ක හිමිකම (අයිතිය) 2018 දෙසැම්බර් 31 දින වන විටත් නගර සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සුසාන භූමිවල අයිතිය පවරා ගත යුතුවේ. | කැස්බෑව නගර සභාවේ පරිපාලනය යටතේ පවතින සුසාන භූමි 13 ක හිමිකම (අයිතිය) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් සතු වන අතර |

| | | |
|---|---|---|
| | | කැස්බෑව නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි |

3.4.2 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | අක්කර 10 රූඩ් 01 පර්චස් 37 ක් විශාල ඉඩම් කැබලි 34 ක වර්තමාන ලිපිනය හෝ වර්තමාන භාවිතය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකල අතර අක්කර 11 රූඩ් 03 පර්චස් 19 ක් විශාල ඉඩම් කැබලි 22 ක් ඵලදායී කටයුත්තකට යොදා නොගෙන හිස් ඉඩම් වශයෙන් පැවතුණි. | අනවසරයෙන් අල්ලා ගැනිම වැළැක්වීම සඳහා සභා සතු ඉඩම් භෞතිකව හඳුනා ගත යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | විගණනයට භාජනය වූ ඉඩම් 74 ක නියැදියෙන් ඉඩම් 56 ක් හෙවත් සියයට 75 ක් ඵලදායී කටයුත්තකට යොදා ගෙන නොතිබුණි. | අනාගත සංවර්ධනය සඳහා සභාවේ ඉඩම් ආරක්ෂා කල යුතුවේ. | ඉඩම් 74 හි සභාව සතු දේපළ 08 ක් ද පාරවල් 2 ක්ද ළිදක්ද අයත් වේ. මේ අනුව පොදු ඉඩම් 63 න් 40ක් හඳුනාගෙන ඇති අතර තවදුරටත් හඳුනාගත යුතු ඉඩම් 23 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරියේදී වාර්තා කරන බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | දිර්ඝ කාලයක සිට වාහන 02 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | අපහරණය කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරි භාණ්ඩ සමීක්ෂණයේදී අපහරණය කිරීමට සටහන් කරගෙන ඇත. |

3.4.3 **වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් රථ පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව සභාව සතු වාහන 26 ක් සඳහා 2018 වර්ෂයට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | 1951 අංක 14 දරන මෝටර් රථ පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | වාහන 04 ක ආදායම් බලපත්‍ර සඳහා චෙක්පත් මඟින් ගෙවීම් කර ඇති අතර ඉතිරි වාහන 22 සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව වෙත ලැබී තිබූ වෙනත් ආයතනවලට අයත් වාහන 05 ක් පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීම කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාහන හා යන්ත්‍ර 03 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කල යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොකළ වාහන හා යන්ත්‍ර ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.4.4 **හඳුනාගත් පාඩු**

**-------------------**

| විගණන නිරීක්ෂණය<br>-------------------------- | නිර්දේශය<br>--------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම.<br>------------------------- |
|---|---|---|
| පාඨකයන්ට නිකුත් කරන ලද රු.464,831 ක් වටිනා පොත් තොගයක් නැතිවූ හා ඉවත් කළ පොත් ලෙස සලකා නිසි අනුමැතියකින් තොරව 2017 හා 2018 වර්ෂ තුළ කපා හැර තිබුණි. | පාඨකයන්ට නිකුත් කරන ලද පොත් අදාල කාල සීමාව තුල ලබා ගැනීමට කටයුතු කල යුතුවේ. | 2017 හා 2018 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි මහා සභා අනුමැතිය ලබාගෙන මෙම පොත් කපා හැර ඇති අතර අදාල සභා අනුමැතින් මේ සමඟ ඉදිරිපත් කරමි. |